තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදී ය.

**කේ. එස්. ටී. ජයසිංහ v දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

**RTIC Appeal** (පෞද්ගලික විභාග කිරීම)/**119/2018 (2018.04.20 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය)**

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.**

**සභාපති** - මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ -ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - **කේ. එස්. ටී. ජයසිංහ** මහතා
**නොතීසිලත් පාර්ශවය** - කේ. එන්. එල්. කේ. විජේනායක, නම්කළ නිලධරයා, සමුපකාර සංවර්ධන කොමසාරිස්, දකුණු පළාත

**පෙනීසිටීම**
**අභියාචක - කේ. එස්. ටී. ජයසිංහ** මහතා සහ නීතිඥ බී ප්‍රියංග
**පොදු අධිකාරිය -** චන්ද්‍රිකා වික්‍රමසිංහ නියෝජ්‍ය කොමසාරිස්

| | |
|---|---|
| **තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය:** | 2017.11.22 |
| **තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | 2012.11.30 (ලැබුණු බව දැන්වීම), 2017.12.18 |
| **නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2017.12.18 |
| **නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | 2017.12.20 |
| RTIC **කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2018.01.04 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2017.11.22 දිනැති ඉල්ලීම මගින් 2012 හෝ ඊට ආසන්න කාලසීමාව තුළ, පොදු අධිකාරයේ සමුපකාර සමිතියේ එක් අංශයකින් තවත් අංශයකට, අභියාචකයාගේ සාමාජිකත්වය මාරු කිරීම සම්බන්ධයෙන් පොදු අධිකාරියේ නිලධාරීන් අතර සිදුවූ ලිපි හුවමාරුවට අදාළ ලිපියක්ඉල්ලා සිටින ලදී.

නමුත් 2017.12.18 දින තොරතුරු දැනගැනීමේ නිලධාරියා විසින් අදාළ තොරතුරු ඉල්ලීම තංගල්ල මහාධිකරණය ඉදිරියේ දැනට පවතින රිට් ආඥාවක් හා සම්බන්ධ බැවින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලදී.
අභියාචක මෙයින් සෑහීමකට පත් නොවූ බැවින් 2017.12.18 දිනැතිව නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එයට නම්කළ නිලධරයා, තොරතුරු දැනගැනීමේ නිලධාරියාගේ ප්‍රතිචාරයම ලබා දෙන ලදී . අභියාචක සෑහීමකට පත්විය හැකි පිළිතුරක් එයින් නොලැබුණු බැවින් 2018.01.04 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය පවසා සිටියේ විභාගවෙමින් පවතින නඩුවක් පවතින බැවින් තොරතුරු ප්‍රතික්ෂේප කර සිටින බවයි. තවදුරටත් පවසා සිටින ලද්දේ, තොරතුරු ප්‍රතික්ෂේප කිරීමේදී වැරදීමකින් 5 (1) (ඌ ) (i) වගන්තිය උපුටා දක්වා ඇති බවත් පොදු අධිකාරිය 5 (1) (ඒ) වගන්තිය ප්‍රකාරව මෙම අවස්ථාවේදී තොරතුරු ප්‍රතික්ෂේප කර සිටින බවත්ය.

**නියෝගය:**

5 (1) (ඒ) වගන්තියේ සඳහන් වන්නේ, 'එබඳු තොරතුරු හෙළිදරව් කිරීම අධිකරණයේ අපහාස කිරීමක් හෝ අධිකරනයේ අධිකාරිය සහ අපක්ෂපාතීත්වය නඩත්තු කිරීමට අහිතකර වන' බැවින්, මෙම ලිපිය 'අධිකරනයේ අධිකාරිය සහ අපක්ෂපාතීත්වය නඩත්තු කිරීමට අහිතකර' වන්නේ කෙසේද යන්න නිශ්චිතව සඳහන් කරමින්, 2018.05.04 දිනට හෝ ඊට පෙර ලිඛිත කරුණු ගොනු කිරීමට පොදු අධිකාරිය වෙත නියෝග කර සිටිමු.

අභියාචනය කල් තබන ලදී.
මීළඟ කැඳවීම් දිනය: 2018.06.05

---

**RTIC Appeal** (පෞද්ගලික විභාග කිරීම)/**119/2018 (2018.06.05 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය)**

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.**

| | | |
|---|---|---|
| **සභාපති** | - | මහින්ද ගම්මම්පිල මහතා |
| **කොමිෂන් සභා සාමාජික** | - | ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන මෙනෙවිය |
| **කොමිෂන් සභා සාමාජික** | - | ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා මහතා |
| **කොමිෂන් සභා සාමාජික** | - | ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් |
| **කොමිෂන් සභා සාමාජික** | - | විනිසුරු රෝහිනී වල්ගම |
| **අභියාචක** | - | **කේ. එස්. ටී. ජයසිංහ** මහතා |
| **නොතීසිලත් පාර්ශවය** | - | කේ. එන්. එල්. කේ. විජේනායක මහතා, නම්කළ නිලධරයා, සමූපකාර සංවර්ධන කොමසාරිස්, දකුණු පළාත |

**පෙනීසිටීම**
**අභියාචක - කේ. එස්. ටී. ජයසිංහ** මහතා
**පොදු අධිකාරිය -** චන්ද්‍රිකා වික්‍රමසිංහ නියෝජ්‍ය කොමසාරිස්, සමූපකාර සංවර්ධන කොමසාරිස්, දකුණු පළාත

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

එහි ලිඛිත කරුණුවලදී අභියාචකයා විසින් ඉල්ලා සිටින ලියවිල්ල සාමාජිකත්වය මාරු කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද පෙත්සමකට ප්‍රතිචාර වශයෙන් සමූපකාර සංවර්ධන කොමසාරිස් (දකුණු පළාත) සහ බාහිර පාර්ශ්වයක් අතර හුවමාරුවූ ලිපියක් බව ද පොදු අධිකාරිය පවසා සිටින ලදී. පොදු අධිකාරිය තවදුරටත් ප්‍රකාශ කර සිටින ලද්දේ එම තීරණය අභියාචකගේ සාමාජිකත්වය මාරු කිරීම හා සම්බන්ධව බවත් ඒ අනුව මෙම අභියාචනයේ විෂය කරුණ වන ලිපියද (දකුණු පළාත් සමූපකාර කොමසාරිස්වරයා විසින් වෙනත් පාර්ශ්වයක් වෙත යවන ලද) ඉහත සඳහන් නඩුවට ඍජුවම සම්බන්ධ බවත්ය. තොරතුරු ඉල්ලීම සිදු කරන ලද අවස්ථාව වන විට නඩු පවරා, ඊට පසු කිහිප වරක් උසාවියෙහි කැඳවා ඇති බවත් පොදු අධිකාරිය පවසා සිටින ලදී.

මෙම තොරතුරු 5 (1) (ඊ) වගන්තිය ප්‍රකාරව මුක්ත තොරතුරක් බවත් පොදු අධිකාරිය පවසා සිටින ලදී. 5 (1) (ඊ) වගන්තිය යටතේ මුක්ත තොරතුරු වන්නේ,

> *ඔවුන්ගේ සේවා සැපයීමේ දී නීතිපතිවරයා හෝ නීතිපතිවරයාට සහාය දක්වන යම් නිලධරයකු සහ පොදු අධිකාරීන් අතර පවතින යම් සන්නිවේදනයක් ඇතුළුව, යම් ලිඛිත නීතියක් යටතේ හෙළිදරව් කිරීම සඳහා අවසර දී නොමැති වූ, වෘත්තිකයන් සහ එම වෘත්තිකයන් විසින් සේවා සපයනු ලබන යම් පොදු අධිකාරියක් අතර පවතින යම් සන්නිවේදනයක සංයුක්ත වන්නා වූ තොරතුරු ය*

තොරතුරු අනාවරණය කිරීම මගින් කිසිදු මහජන සුභාසිද්ධියක් නොමැති බව ද පොදු අධිකාරිය පවසා සිටින ලදී.

**නියෝගය:**

මෙම අභියාචනයේ පෙර විභාගයේ දී කොමිෂන් සභාව විසින් සඳහන් කර ඇති පරිදි, උසාවියේ විභාග වෙමින් පවතින නඩු විභාගයක් පැවතීම පමණක් හේතුකොටගෙන 5 (1) (ඒ) වගන්තිය හෝ 5 (1) (ඊ) ට යටත්ව තොරතුරු මුක්ත වීමක් සිදු නොවන බව, පොදු අධිකාරියේ අවධානයට යොමු කර සිටිමු. තවද පොදු අධිකාරිය විසින්, මෙම වගන්ති දෙක තුළට තොරතුරු ඇතුලත් වන්නේ යන්න කෙසේද යන්න පෙන්වා දීමට අපොහොසත් වී ඇති බැවින්, අදාළ තොරතුරු ඉල්ලීම අනාවරණය කිරීම කිරීමෙන් සිදුවන මහජන සුභසිද්ධිය 'තොරතුරු අනාවරණය වීමෙන් ඇතිවන හානියට වඩා වැඩි නොවන බව පවසා කරනු ලබන තර්කයද පවත්වාගෙන යා නොහැකිය. මෙම අවස්ථාවෙහි දී "තොරතුරු හෙළිදරව් කිරීම අධිකරණයට අපහාස කිරීමක් හෝ අධිකරණයේ අධිකාරි බලය හා අපක්ෂපාතීබව පවත්වාගෙන යාමට අගතියක් සිදු වන අවස්ථාවක් බව පෙන්වීමට පොදු අධිකාරිය අසමත් වී ඇත. තවද, පොදු අධිකාරියක් විසින් නීතිපති දෙපාර්තමේන්තුවට නඩුවක් සඳහා ගොනු කිරීමට ලබා දී ඇති ලේඛනයක්ය යන පදනම මතම 5 (1) (ඒ) වගන්තිය ප්‍රකාරව මුක්ත නොවන්නේ එම වගන්තිය ප්‍රකාරව මුක්ත වන්නේ යම් 'ලිඛිත නීතියක් යටතේ හෙළිදරව් කිරීම සඳහා අවසර දී නොමැති' තොරතුරක් පමණි. ඒ සඳහා පොදු අධිකාරිය කිසිදු නීතියක් උපුටා දක්වා නොමැත.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදී ය.

මෙම අභියාචනයෙන් ඉල්ලා ඇති තොරතුරු, තංගල්ල මහාධිකරණය දැනට ගොනුකර ඇති රිට් (W) 03/2017 නඩු විභාගය සඳහා සෘජුවම හෝ වක්‍රව සම්බන්ධ වන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා රිට් (W) 03/2017ට අදාළව ඉදිරිපත් කරන ලද සියලු ලේඛන කොමිෂන් සභාව වෙත නියෝගය ලැබීමෙන් සති දෙකක් ඇතුලත යොමු කිරීමට පොදු අධිකාරියට නියෝග කර සිටිමු.අභියාචනය කල් තබන ලදී.
මීළඟ කැඳවීම් දිනය: 2018.08.14